# බස්නාහිර පළාතේ පළාත් සභා රැස්වීම

## 2018 මැයි මස 22 වන අඟහරුවාදා

**බත්තරමුල්ල, ශ්‍රී ජයවර්ධනපුර, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ, අංක 204 හි පිහිටි**
**බස්නාහිර පළාත් සභා ගොඩනැගිලි සංකීර්ණයේ සභා ශාලාවේදී පවත්වන ලද රැස්වීම**

පූ.භා. 09.40 ට සභාව රැස් විය. ගරු සභාපතිතුමා මූලාසනාරූඪ විය.

**•පැමිණීම :**

| | |
|---|---|
| ගරු සුනිල් විජේරත්න | (සභාපතිතුමා) |
| ගරු යසපාල කෝරලගේ | (නියෝජ්‍ය සභාපතිතුමා) |
| ගරු ඉසුර දේවප්‍රිය | (බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍ය, මුදල් හා ක්‍රමසම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බලශක්ති, පරිසර කටයුතු, ජලසම්පාදන හා ජලාපවාහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමා) |
| ගරු ගාමිණී තිලකසිරි | (බස්නාහිර පළාතේ කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග, ධීවර, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සහ ගොවිජන සංවර්ධන අමාත්‍යතුමා) |
| ගරු ලලිත් වනිගරත්න | (බස්නාහිර පළාතේ මාර්ග, ප්‍රවාහන, සමූපකාර සංවර්ධන හා වෙළඳ, නිවාස හා ඉදි කිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රාම සංවර්ධන අමාත්‍යතුමා) |
| ගරු සුමිත් ලාල් මැන්දිස් | (බස්නාහිර පළාතේ සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභ සාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා, කාන්තා කටයුතු සහ සභා කටයුතු පිළිබඳ අමාත්‍යතුමා) |
| ගරු හෙක්ටර් බෙත්මගේ | (සභා නායකතුමා) |
| ගරු ලාලන් සුදත් මංජු ශ්‍රී අරංගල | (විපක්ෂ නායකතුමා) |
| ගරු චන්දන ජයකොඩි | (ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා) |
| ගරු යූ. ජෝර්ජ් පෙරේරා | (විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා) |

**ගරු මන්ත්‍රීවරු**

| | | |
|---|---|---|
| අනන්ද හරිස්චන්ද්‍ර ද සිල්වා | ජයන්ත ද සිල්වා | යූ.එල්.එන්.පී. උඩවෙල |
| අනුරාධ විමලරත්න | ඩී.ඩබ්ලිව්. පුෂ්පකුමාර ද සිල්වා | රන්දීර් රොද්‍රිගෝ |
| අනුරුද්ධ ලේකම්ගේ | ඩෝල්ටන් ජානක සූරියබණ්ඩාර | රවින්ද්‍ර යසස් කුමානායක |
| අසෝක රන්වල | තුවාන් ආමීත් මොහමඩ් අක්රම් | රොජර් සෙනෙවිරත්න |
| අමල් සිල්වා | තෙබුවන පියනන්ද හිමි | රොඩ්නි රුඩොල්ෆ් ෆ්‍රේසර් |
| අර්ෂාඩ් නිසාම්ඩීන් | නව්සර් ෆව්සි | රෝස් ප්‍රනාන්දු මෙනෙවිය |
| ඊ.ඒ. නන්දන පත්මකුමාර | නිමල් ආර්. පීරිස් | ලක්ෂ්මන් නිපුණ ආරච්චි |
| උදාර රත්නායක | නිරෝෂ් ඩිල්ෂාන් ජයවර්ධන | ලයනල් ජයසිංහ |
| උදේන විජේරත්න | නිරෝෂා අතුකෝරල මැතිනිය | ලලන්ත ගුණසේකර |
| උපාලි කොඩිකාර | නිශාන්ත ශ්‍රී වර්ණසිංහ | ලලිත් එල්ලාවල |
| උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ | නීල් සුනේත්‍රලාල් ප්‍රනාන්දු | ලලිත් වර්ණකුමාර |
| එම්.එස්.එම්. රහීම් | පංචරත්නම් රාම් | විජිත් ප්‍රියන්ත |
| එස්.එම්. සකාවුල්ලා | පී.ආර්.පී. අබේගුණවර්ධන | සන්ධ්‍යා සිරිවර්ධන මැතිනිය |
| ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව | පී.ඩී. අබේරත්න | සරත් පතිරණ |
| කීර්ති කාරියවසම් | ප්‍රදීප් උඳුගොඩ | සිරිකමල් පිලිෂියන් ද සිල්වා |
| කුරුසාමි කලන්කාඩ් තේවර් | බී.පී. ලක්ෂ්මන් ගුණවර්ධන | සුනිල් වටගල |
| කෝකිලා හර්ෂනී ගුණවර්ධන මැතිනිය | මල්ෂා කුමාරණතුංග මැතිනිය | සුනිල් ජයමිණි |
| ගුණසිරි ජයනාත් | මහේෂ් අල්මේදා | සුමිත් විජයමුණි ද සොයිසා |
| චන්ද්‍රසෝම සරණලාල් | මෙරිල් පෙරේරා | සුසිල් කිඳෙල්පිටිය |
| ජගත් කුමාර | මොරිස් විජේරත්න | ශිරන්ත අමරසේකර |
| ජනක කුරුප්පු | මොහොමඩ් ෆයිරූස් | හරිස්චන්ද්‍ර කොස්තා |
| ජනක දීපාල් වැලිවත්ත | මොහොමඩ් ෆායිස් | |

**නොපැමිණීම :**

| | |
|---|---|
| ගරු රංජිත් සෝමවංශ | (බස්නාහිර පළාතේ අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමා) |

**ගරු මන්ත්‍රීවරු**

| | | |
|---|---|---|
| ඇන්ටනි උපුල් රාජිත | කේ.ඩී. අරුණ දීපාල් | රජිත හපුආරච්චිගේ |
| ඇ. ශ්‍රීනාත් ම. පෙරේරා | කොලන්නගේ වජිර පෙරේරා | රවී විජේසේකර |
| ඉන්දික බණ්ඩාර | ගමගේ නිහාල් ප්‍රේමශාන්ත පෙරේරා | ලෙනාඩ් කරුණාරත්න |
| ඉෆ්තිකාර් ජෙමිල් මරික්කාර් | ජගත් අංගගේ | සලෝචන ගමගේ |
| උපාලි ගුණරත්න | ජගත් පී. විතාන | සහන් ප්‍රදීප් |
| එස්.ඒ. සමන්මලී සකලසූරිය මැතිනිය | නිමල් චන්ද්‍රරත්න | සුසාර දිනාල් |
| එස්. කුහවර්දන් | නිරෝෂන් පාදුක්ක | සෙනල් වෙල්ගම |
| කාමල් කුරුප්පු | ප්‍රදීප් පෙරේරා | ශ්‍රීනාත් පෙරේරා |
| කිත්සිරි කහටපිටිය | මහින්ද ජයසිංහ | |
| කිත්සිරි මංචනායක | මංජුල බුද්ධදාස | |

## 01. අභිනව මන්ත්‍රීවරුන්ගේ ප්‍රතිඥා දීම / දිවුරුම් දීම

*"අශෝක දයාරත්න ගරු මන්ත්‍රීතුමාගේ අභාවය හේතුකොටගෙන ගම්පහ පරිපාලන දිස්ත්‍රික්කය සඳහා ඇති වූ මන්ත්‍රී ධූර පුරප්පාඩුව පුරවනු පිණිස ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ ගරු ජනක කුරුප්පු මැතිතුමා තේරී පත් වී ඇති බව මැතිවරණ කොමිෂන් සභාව විසින් 2018.05.15 දිනැති අංක 2071/18 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත් කර තිබෙන බවත්, ඒ අනුව ජනක කුරුප්පු ගරු මන්ත්‍රීතුමා 2018.05.18 වන දින තමන් ඉදිරියේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූලව නිල ප්‍රතිඥාව දී ඇති බවත් ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී."*

***අනතුරුව, අභිනව ගරු මන්ත්‍රීතුමා සභා ගර්භයේ අසුන් ගන්නා ලදී.***

## 02. සභාපතිවරයාගේ නිවේදනය :

*i*

***පළාත් රාජ්‍ය ගිණුම් කාරක සභාව :***

*"නව කාර්ය පටිපාටි රීති සංග්‍රහය අනුව ගිණුම් කාරක සභාවේ ඇති කර ඇති නව සාමාජික තනතුර සඳහා පළාත් සභා මන්ත්‍රී පංචරත්නම් රාම් ගරු මන්ත්‍රීතුමා පත් කර ඇති බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී."*

*ii*

*"බස්නාහිර පළාත් සභා මන්ත්‍රී සිරිකමල් පිලිෂියන් ද සිල්වා ගරු මන්ත්‍රීතුමා පළාත් අධ්‍යාපන හා සංස්කෘතික, කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශයේ උපදේශක කාරක සභා සාමාජිකත්වයෙන් ඉල්ලා අස් වන බවට 2018.05.13 වන දිනැතිව ලිපියක් ඉදිරිපත් කර ඇති බවත්, ඒ අනුව ගරු මන්ත්‍රීතුමා එම උපදේශක කාරක සභා සාමාජිකත්වයෙන් ඉවත් කර එදින සිට පළාත් ධීවර, මාර්ග, ප්‍රවාහන, සමූපකාර සංවර්ධන හා වෙළඳ, නිවාස හා ඉදි කිරීම් සංවර්ධන පිළිබඳ අමාත්‍යාංශ උපදේශක කාරක සභා සාමාජිකයෙකු ලෙස පත් කරන බවත් ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී."*

*iii*

*"ගරු ආණ්ඩුකාරතුමා විසින් එවා ඇති විගණකාධිපති වාර්තා 13 ක්* [1] *පළාත් රාජ්‍ය ගිණුම් කාරක සභාවට යොමු කරන බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී."*

*iv*

*"2018.05.08 දින සිට ක්‍රියාත්මක රීතීන්හි 36 රීතියට අනුව, කාලීන වැදගත්කමකින් යුත් පෞද්ගලික ප්‍රකාශයක් ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන ගරු මන්ත්‍රීවරයෙකු එම ප්‍රකාශය තම ලිපි ශීර්ෂයක සවිස්තරාත්මකව ලියා සභා රැස්වීමට පෙර දින ප.ව. 4.15 ට පෙර තමා වෙත හෝ සභා ලේකම්තුමා වෙත ලැබීමට සැලැස්විය යුතු බවත්, එම විධිවිධාන සඳහා 36 රීතිය කෙරෙහි සියළු දෙනාගේම අවධානය යොමු කරවන බැවින්, පෞද්ගලික ප්‍රකාශ ඉදිරිපත් කිරීමේදී එම රීතියෙහි දැක්වෙන පරිදි සම්පූර්ණ ප්‍රකාශය ලිඛිතව ඉදිරිපත් කරන මෙන් ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී. "*

*v*

*"ගරු මන්ත්‍රීවරුන්ගේ වරප්‍රසාද කඩවීම් හා සම්බන්ධ ප්‍රකාශ ඉදිරිපත් කිරීමේදී අදාළ වන්නා වූ රීති 37 කෙරෙහි අවධානය යොමු කරවන අතර, ඒ අනුව 37(2) රීතියට අනුව සභා පරිශ්‍රය තුළ ඇති වන ගරු මන්ත්‍රීවරයෙකුගේ වරප්‍රසාද කඩවීමක් සම්බන්ධයෙන් වන විටකදී හැරෙන්නට යම්*

[1] 2018.05.22 වන දින නිල වාර්තාව බලන්න.

*ගරු මන්ත්‍රීවරයෙකුගේ වරප්‍රසාද කඩවීමක් පිළිබඳව එම ගරු මන්ත්‍රීතුමා විසින් ලිඛිතව තමා වෙත අදාළ ආකෘතිය පූරවා පෙ.ව. 09.30 ට පෙර ලබා දිය යුතු බවත්, එම ආකෘතිය අද දින සභාගත කරන ලද පසුගිය සභා කටයුතු කාරක සභා රැස්වීම් වාර්තාව සමඟ සියලුම ගරු මන්ත්‍රීතුමන්ලා වෙත ලැබීමට සලස්වා ඇති අතර, සභා පරිශ්‍රය තුළදී සිදු වන වරප්‍රසාද කඩවීමකදී හැරෙන්නට සෙසු වරප්‍රසාද කඩවීම් සම්බන්ධව එම ආකෘතිය සම්පූර්ණ කර සභා රැස්වීම් දින පෙ.ව. 09.30 ට පෙර ඉදිරිපත් කළ යුතු බවත්,*

*නව රීති සංග්‍රහය 2018.01.09 දින නිල වාර්තාව සමග ගරු මන්ත්‍රීතුමන්ලා වෙත ලබා දී ඇති අතර, එම රීති ඇතුළත් පුස්තකය ඉදිරියේදී ලැබීමට සැලැස්වීමට පියවර ගන්නා බවත් ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී. "*

## 03. නොපැමිණ සිටීමේ අවසරය :

*සුසාර දිනාල් ගරු මන්ත්‍රීතුමාට මාස 03 ක් රැස්වීම්වලට නොපැමිණ සිටීමට අවසර දිය යුතු යැයි ලලිත් වර්ණකුමාර ගරු මන්ත්‍රීතුමා විසින් ද ඉදිරිපත් කරන ලද යෝජනාවත් සභා සම්මත විය."*

## 04. කාරක සභා වාර්තා :

2018.05.09 වන දින පැවැති සභා කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීම් වාර්තාව ගරු සභාපතිතුමා විසින් පිළිගන්වන ලදී.

***පූ.භා. 10.39 ට ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු නියෝජ්‍ය සභාපතිතුමා [යසපාල කෝරලගේ මහතා] මූලාසනාරූඪ විය.***

## 05. පළාත් සභාවේ කටයුතු I :

සුමිත් ලාල් මැන්දිස් සභා කටයුතු ගරු අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලද පහත සඳහන් යෝජනාව සභා සම්මත විය.

*"අද දින න්‍යාය පත්‍රයේ පොදු කටයුතු විෂයය යටතේ අංක (01) හි සඳහන් වැඩ කටයුතු සඳහා රීති අංක 52(5), 57(1), 57(4) හා 57(5) හි සඳහන් විධිවිධානයන්ගෙන් කිනම් හෝ බාධාවක් සිදු නොවිය යුතු යැයි සලකා ක්‍රියා කළ යුතුය."*

## 06. රීති අංක 110 යටතේ යෝජනාව :

ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලදුව, සුනිල් වටගල ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කරන ලද පහත සඳහන් යෝජනාව සභා සම්මත විය.

*"පොදු වැදගත්කමකින් යුක්ත වූද, කාලීන වූද පහත සඳහන් යෝජනාව සභාවට ගෙන ඒම සඳහා කාර්ය පටිපාටි රීති 14(6), 14(7)(ආ), 19(1), 19(3), 39, 53(2), 53(3) යන රීති අත්හිටුවිය යුතු බවට යෝජනා කර සිටී."*

## 07. පෞද්ගලික මන්ත්‍රී යෝජනාව :

ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලද පහත සඳහන් යෝජනාව සරත් පතිරණ ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කරන ලදී.

*"රට තුළ වෙසෙන වැඩ කරන ජනතාව ඇතුළුව මුළු මහත් ජනතාව මුහුණ දෙන ජීවන වියදම දරා ගන්නේ කෙසේද යන ගැටළුවට තවත් බරක් ලෙස ඩීසල්, පෙට්‍රල් හා භූමිතෙල් මිල වැඩවීමත්, ගෑස් මිල වැඩි වීමත් පිළිබඳව වගකිව යුතු පාලකයන් විසින් විශේෂ අවධානයට යොමු කළ යුතුය. ඇමෙරිකානු ඩොලරයට සාපේක්ෂව රුපියලේ අගය අවප්‍රමාණය වීමත් සමගින්ද බැඳී ඇති මෙම තත්ත්වය නිසා දරිද්‍රතා මට්ටම තවත්*

*ඉහළ යමින් පවතී. නිෂ්පාදන ආර්ථිකය බිඳ වැටීම, අපනයන ආදායම් අඩුවීම, ණය, බදු හා දඩ මත යැපෙන රටක් බවට පත් කිරීම, වංචා දූෂණ තත්ත්වයත්, රැකියා වියුක්තිය මෙන්ම රැකියා අවස්ථා පිළිබඳව සමාජ ආකල්පයන් ද සමඟ බැඳී ඇති මෙම තත්ත්වයට පැවැති සහ පවතින පාලනය වගකිව යුතු අතර, ජනතාව මත බර පැටවීම වෙනුවට නාස්තියෙන් තොර පාලනයකට යොමු වන ලෙසත්, වහාම තෙල් හා ගෑස් මිල අඩු කරන ලෙසත් රජයෙන් ඉල්ලා සිටී."*

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***

***අ.භා. 12.35 ට සභාවේ ගණපූරණය නොමැති බව මොහොමඩ් ෆායිස් ගරු මන්ත්‍රීතුමා විසින් පෙන්වා දෙන ලදින්, ගරු නියෝජ්‍ය සභාපතිතුමා විසින් කැදවීම් සීනුව නාද කරවීමට නියෝග කරන ලදී.***

***පසුවද, ගණපූරණය සම්පූර්ණ නොවූ බැවින්,***

## 08. **16(1) යටතේ සභාව කල් තැබීම :**

ගරු නියෝජ්‍ය සභාපතිතුමා විසින් පළාත් සභාව කල් තබන ලදී.

***ඊට අනුකූලව, පළාත් සභාව අ.භා. 12.46 ට, 2018 ජුනි මස 05 වන දින පූ.භා. 09.30 වන තෙක් කල් ගියේය.***

හේමන්ත සමරකෝන්,<br>
ලේකම්,<br>
බස්නාහිර පළාතේ පළාත් සභාව.

2018.05.22<br>
බස්නාහිර පළාතේ පළාත් සභාව,<br>
5 වන මහල,<br>
බී පර්යන්තය,<br>
සෙත්සිරිපාය,<br>
බත්තරමුල්ල.

පූර්/22<br>
Minuts 2018.05.22 - Hansard Sectionr